## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
## 2014 මැයි මස 20 වන දින පෙ.ව. 09.30

# න්‍යාය පත්‍රය

**I.** සභාපතිවරයාගේ නිවේදන

**II.** ලිපි ලේඛන පිළිගැන්වීම

**III.** කාරක සභා වාර්තා පිළිගැන්වීම

**IV.** පෙත්සම්

**V.** ප්‍රශ්න

**01.** ගරු අජන්ත නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට : **(ප්‍ර/vi(1)/14/01)**

අ. බස්නාහිර පළාතේ දිස්ත්‍රික් තුනෙහි බස්නාහිර පළාත් සභාව යටතේ පාලනය වන පාසැල්වල 2013 වසරේ අ.ෙපා.ස. (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල අනුව එම දිස්ත්‍රික්ක 03 සඳහා ශ්‍රී ලංකාවේ හිමි වී ඇති ස්ථාන 03 කවරේද?

ආ. බස්නාහිර පළාත් සභාව යටතේ 2013 සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණ ද?

ඇ. පළාත් සභාව යටතේ පාලනය වන පාසල් වලින් ගණිතය විෂයන් අසමත් වූ සිසු සිසුවියන් සංඛ්‍යාව කීයද?

ඈ. පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල ඉංග්‍රීසි විෂයන් අසමත් වූ සිසු සිසුවියන් කීයද?

ඉ. එම ප්‍රතිඵල පිළිබඳව ඔබතුමා සෑහීමකට පත් වේද?

ඊ. නො එසේ නම් ඒ මන්ද? ගත් පියවර කවරේද?

**VI.** නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

**VII.** අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ කටයුතු I

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :**

**යෝජනාව :**

*"අද දින පොදු කටයුතු සඳහා වෙන් කළ දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතුය."*

## X. සභාවේ කටයුතු II

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :**

**යෝජනාව :**

*"අද දින න්‍යාය පත්‍රයේ වැඩ කටයතුවලදී රීති අංක 57 (1), 57(4), 57(5) හා රීති අංක 86(2), 91(1) හා රීති අංක 110 හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## XI. පොදු කටයුතු

**01.** **ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා (බ.ප) :**

*"2014 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන මුදල් ප්‍රකාශ සංශෝධනය - 2014", අනුමත කළ යුතුය."*

**02.** **ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා (බ.ප) :**

*"2014 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශ සංශෝධනය - 2014', ට අදාළ වූ 2014 අංක ......... දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

**03.** **ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා (බ.ප) :**

**යෝජනාව :**

**<u>පළාත් සහා අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2013 වර්ෂය</u>**

"අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2013" නැමැති උපලේඛනයේ දැක්වෙන පරිදි, අත්තිකාරම් සීමාවන් සංශෝධනය කිරීමේදී 2012 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තියේ 07 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින්ද,

එම සංශෝධනයන් සිදු කිරීම සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සභාවේ අනුමැතියට යටත්ව ලබා දී ඇති හෙයින්ද,

එම උපලේඛනයේ දැක්වෙන පරිදි, එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරයි. "

**04. ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම වෙනුවෙන් වූ ස්තුති යෝජනාව :**

2014.04.30 දින සභා රැස්වීමේදී ගරු හෙක්ටර් බෙත්මගේ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරනු ලැබ ගරු ඒ.ඩී. ගාමිණී තිලකසිරි මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරනු ලැබීමෙන් අනතුරුව, 2014.05.20 දිනට කල් තබන ලද විවාදය.

*"ජනවරමින් නැවතත් තහවුරු කළ අපරිමිත ජනතා විශ්වාසයට ගරු කරමින් හා සියලුම දේශපාලන පක්ෂවල සාධාරණ හා ඵලදායී දේශපාලන අදහස්වලට ගරු කරමින්ද, බස්නාහිර පළාතේ මානව හා භෞතික සම්පත් ඒකරාශී කර දැනට රට පුරා ක්‍රියාත්මක දැවැන්ත ජාතික සංවර්ධන වැඩ පිළිවෙළට සමගාමීව මධ්‍යම රජයේ සහාය තවදුරටත් ලබා ගනිමින් ක්‍රියාත්මක කරන සංවර්ධන ක්‍රියාදාමයන් තුළින් සංවර්ධන ප්‍රතිලාභ සැමට බෙදී යන අන්දමින් ද බස්නාහිර පළාත් ජනතාවගේ ඒකායන බලාපොරොත්තුව වූ කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කයන්හී නාගරික හා ග්‍රාමීය හා වතු අංශයන්හී පොදු මහජනතාවගේ දියුණුව සැලසීම උදෙසා, පළාත තුළ ආර්ථික සංවර්ධනයක් ඇති කර පළාත් ජනතාවගේ ආර්ථික, සමාජ, සංස්කෘතික, ආගමික හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ පෙරදැරිව බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය බස්නාහිර පළාතේ පළාත් සභාවේ VI වන පළාත් සභාව සඳහා සකස් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය 2014 අප්‍රේල් මස 30 වන දින එනම් (අද දින) මෙම පළාත් සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාර අල්හාජ් එස්. අලවි මව්ලානා මැතිතුමා වෙත මෙම පළාත් සභාව මහත් ගෞරවයෙන් යුතුව සිය ස්තූතිය පළ කර සිටියි."*

## XII. සභාව කල් තැබීම

කේ.ඒ.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.05.07 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහළ, B පර්යන්තය,

සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

Agenda - 2014.05.20